**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව - 2023**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.108,843,509ක ඉඩම් 115ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධනයෙන් ආදායමට දායක වීමේ ගිණුමට ගැලපීම සිදු කරන බව. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයට අදාළ රු.66,780ක අධි විගණන ගාස්තු වෙන් කිරීම සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙන් කිරීමේ ගිණුමට ගැළපීම් නොකර ණයහිමි ගිණුමට ගැළපීම් කර තිබුණි. | හඳුනාගැනීමේ පහසුව සලකා ණය හිමියන් යටතේ ඉදිරිපත් කර ඇති බව. | එම |
| (ඇ) | ඇල්බට් පීරිස් ක්‍රීඩාපිටියේ රසායනික ද්‍රව්‍ය ගබඩා කාමරය සඳහා වැය කරන ලද මුදල ප්‍රාග්ධනිත කිරීමේදී රු.124,416ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම්ගත කරන ලද වටිනාකම නිවැරදි බව. | එම |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ වැඩ නිම කරන ලද රු.15,967,716ක වටිනාකමැති ඉදිකිරීම් 07ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | එම |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍ා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂ දෙකක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.25,084,176ක් වූ අතර උප ලේඛන අනුව රු.24,850,380ක් වූයෙන් රු.344,568ක වෙනසක් විය. | ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | වෙනසට හේතු පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 2017 සිට 2023 වර්ෂය දක්වාම මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.27,175,869ක් වූ විලම්භිත අයවිය යුතු ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී උත්සාහ දරා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.30,044,950ක් වටිනා ගිණුම් ශේෂ 06ක්, භෞතික පැවැත්ම, උපලේඛන සහ ඊට අදාළ අනෙකුත් සාක්ෂි නොතිබීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | උපලේඛන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කළ හැකි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|---|
| (අ) | **1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත** | | | |
| | (i) 129(2) (අ) සහ (ඊ) වගන්ති | ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු උසාවි දඩ, මුද්දර ගාස්තු හා බදු කුලී හා කඩ කුලී විධිමත් පරිදි ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි. | ආදායම් නිසි ලෙස අය වෙමින් පවතින බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 143 වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වසර 05කට වරක් තක්සේරු කර ඒ අනුව බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු කිරීමේ කටයුතු කරමින් පවතින බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iii) 159 වගන්තිය | සමාලෝචිත කාල සීමාව තුල ගෙවීම් පැහැර හරින ලද ව්‍යාපාර හා කර්මාන්ත බදු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රතු නිවේදන නිකුත් කිරීම මඟින් හිඟ බදු මුදල් අයකර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ, පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.127,946,180ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වූ වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.96,054,678ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 17,965 | 18,998 | 15,859 | 7,052 | 19,610 | 20,037 | 16,005 | 9,531 |
| කුලී | 30,027 | 35,649 | 35,537 | 2,856 | 36,642 | 31,134 | 28,698 | 3,987 |
| බලපත්‍ර ගාස්තු | 4,065 | 5,087 | 5,087 | 479 | 4,290 | 3,817 | 3,817 | 264 |
| වෙනත් ආදායම් | 19,445 | 21,100 | 13,945 | 7,142 | 17,823 | 17,703 | 8,782 | 7,360 |
| එකතුව | 71,502 | 80,834 | 70,428 | 17,529 | 78,365 | 72,691 | 57,302 | 21,142 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු.6,874,378ක්, අක්කර බදු රු.35,876ක් සහ කුලී රු.2,865,567ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2023 දෙසැම්බර් 31දිනට මුද්දර ගාස්තු හිඟ ශේෂය රු.221,923,591ක් ද උසාවි දඩරු.66,714,364ක් ද අයවිය යුතුව තිබුණි. ඉන් වර්ෂ 01ට අඩු උසාවි දඩ අයවිය යුතු ශේෂය රු.62,836,287ක්ද වර්ෂ 01ට වැඩි වර්ෂ 05දක්වා උසාවි දඩ රු.3,878,077ක්ද විය. | මෙම හිඟ මුදල ඉදිරියේදී කඩිනමින් අය කර ගැනීමට හැකිවනු ඇති බව. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.3 අධිභාර

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තිය ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව පළාත් පාලන කොමසාරිස් (වයඹ)ගේ 2018 පෙබරවාරි 15 දිනැති ව.ප.පා.දෙ. 02/09/01/01ගි.කා.2006 දරන ලිපිය අනුව රු.326,355ක් අයකර ගැනීමට තිබුණි. | අධිභාර මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | අධිභාර අයකර ගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | CAT – 2020 පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා 2019 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.949,800ක්ද 2023 වර්ෂයේ සේවා ගිවිසුම සඳහා රු.214,286ක්ද වශයෙන් එකතුව රු.1,164,086ක් ගෙවා තිබූ අතර එම පද්ධතියේ අඩුපාඩු රැසක් පැවතීම හේතුවෙන් වාර්තා ලබා ගැනීමට නොහැකි වී තිබූ අතර මේ දක්වා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | CAT - 2020 පරිගණක පද්ධතියේ අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 නොවැම්බර් 25 දිනැති අංක 2308 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයට අනුව වෙළඳ බලපත්‍ර සඳහා ගාස්තු 2023 මාර්තු 31 දිනට පෙර අයකර ගත යුතු වුවත් ආයතන 30ක් සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඒ සඳහා නඩු පැවරීමටද කටයුතු කර නොතිබුණි. | සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයේ ප්‍රමාදය නිසා බලපත්‍ර ගාස්තු අයකර ගත නොහැකි වූ බව. | ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දංකොටුව උප කාර්යාලයට අයත් කඩ කාමර බදුදීමට අදාළ ගිවිසුමේ 20 වගන්තිය ප්‍රකාරව ජල බිල්පත් ගෙවීම බදුකරු විසින් සිදු කළ යුතු වුවත් ජල මීටර් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් රු.237,770ක ජල බිල්පත් සභාව විසින් දරා තිබුණි. | විදුලි බිල පමණක් අප විසින් ගෙවනු ලැබන බව. | බදුකරුගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2023 වර්ෂය සඳහා සේවාවන් සැපයීමට අදාළ ගාස්තු සැකසීම සම්බන්ධ 2022 නොවැම්බර් 25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ දැක්වෙන පරිදි ගාස්තු අයකළ යුතු වුවත් එයට පටහැනිව හා සභා | ක්‍රීඩාංගන හැකිතාක් ගාස්තු සහිතව නිකුත් කරන බව. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුමැතියකින් තොරව සභාපතිවරයා විසින් දින 49ක් සඳහා දංකොටුව නගර ශාලාව හා ජයකොඩි ක්‍රීඩාපිටිය ගාස්තු අයකිරීමෙන් තොරව ලබා දී තිබූ අතර අයකළ යුතු ගාස්තුව රු.410,000ක් විය. | | |
| (ඉ) | වයඹ පළාත් සභාව විසින් 2013 අංක 01 දරන ප්‍රඥප්තිය මඟින් ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචි කරවීම හා අධීක්ෂණය එම ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයට පවරා දී තිබුණු නමුත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථාපිත ප්‍රජාමූල සංවිධාන 15ක් සභාව විසින් හඳුනාගෙන තිබුණු අතර ඉන් 14ක් වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකයේ ලියාපදිංචි කරවීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ලියාපදිංචි කිරීමට කටයුතු කරන බව. | ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2023 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.87,097,297ක් වූ අතර ඒ තුළ අවුරුදු 05 ඉක්ම වූ රු.1,680,316ක ශේෂයක්ද විය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.135,248,449ක් වූ අතර ඉන් අවුරුදු 05කට වැඩි රු.10,000,000ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අවු. 05ට වැඩි ශේෂය දංකොටුව පෙර පාසල් ගොඩනැඟිල්ල ඉදිකිරීමට වෙන්කල ණයහිමි ශේෂයක් බව. | ණයහිමියන් කඩිනමින් පියවීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | කඩ කාමර 70ක් සඳහා 1994 වර්ෂයේදී අත්සන් කළ ගිවිසුම් 2023 වන විටත් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | අඩුපාඩු සකස් කර නැවත ගිවිසුම් ලබාදීමට කටයුතු කරමින් පවතින බව. | ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කඩ කාමර 29ක් සඳහා අත්සන් කළ ගිවිසුම්වල ආරම්භක දිනයක් හා අවසාන දිනයක් සඳහන් කර නොතිබුණි. | අඩුපාඩු සකස් කර නැවත ගිවිසුම් ලබාදීමට කටයුතු කරමින් පවතින බව. | ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කඩ කාමර 41ක් සඳහා 2023 සැප්තැම්බර් 12 දින වන විටත් ගිවිසුම් අත්සන් කිරීමට කටයුතුසිදු කර නොතිබුණි. | තක්සේරු කර එම තක්සේරු මුදලට අනුව ගිවිසුම් සකස් කර කඩ කාමර ලබාදීමට කටයුතු කරන බව. | ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2018 ජූලි මස සිට බිල්කිරීම් නවතා ඇති කඩ කාමර 13ක්ද ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත හිඟ මුදල් ලේඛනයෙන් ඉවත් කර ඇති කඩ කාමර 13ක්ද බදුදීමට කටයුතු කර නොතිබුණි. | බදු දීම සඳහා ඉදිරි කටයුතු සකස් කරමින් පවතින බව. | කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය අනුව සභාවට උපදෙස් ලබා ගැනීම සඳහා පත්කර තිබූ පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව විසින් විවිධ කාර්යයන් සඳහා කරන ලද අවිධිමත් වූ යෝජනා සම්මතයන් මහා සභාව විසින් පිළිගෙන තිබූ අතර 2010 වර්ෂයේ සිට 2023 ජූලි දක්වා විථි පහන් දැල්වීමේ හා නිවීමේ දීමනා ලෙස පුද්ගලයින් තිදෙනෙකුට රු.741,000ක් ගෙවීම් කර තිබුණි. | ගෙවීම් ක්‍රියාවලිය නවත්වා ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ක්‍රිඩාංගන 23ක පැවැත්ම හා ඒවායේ දේපළ සම්බන්ධයෙන් තහවුරුවක් ලබාගෙන නොතිබුණි. | සමීක්ෂණයක් සිදු කර යාවත්කාලීන කිරීම ආරම්භ කර ඇති බව. | දේපළවල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මස් හා මාලු වෙළඳසැල්07කින්, වැසිකිළි පද්ධති 02කින්, බයිසිකල් නැවතුම්පලකින් හා පොල් එළදාව සහිත ඉඩම් 09කින් ලැබිය යුතු ආදායම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | බදු ලබාදීමට ඉල්ලුම් කලද ගැනුම්කරුවන් ඉදිරිපත් නොවුණු බව. | වත්කම් බදු දී ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභා බල ප්‍රදේශය තුල පවරා නොගත් දේපළ 99ක් පැවති අතර එයට කාර්යාල, පොදු වෙළඳ පොලවල්, පෙර පාසල්, පුස්තකාල, ප්‍රජා ශාලා හා සුසාන භූමි අයත් විය. | සියළු දේපල පවරා ගැනීමට කටයුතු සිදු කර ඇති බව. | අදාළ දේපළවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඈ) | වටිනාකමක් සඳහන් නොකළ ඉඩම් 12ක වෙළඳපළ අගය තක්සේරු කර නොතිබුණි. | වෙළඳපල අගය තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | නයිනමඩම සාන්ත අන්තෝනි මාවත ප්‍රිමික්ස් ඇතිරීම සඳහා බාහිර ආයතනයක් සමඟ රු.1,116,748ක මුදලකට ගිවිසුම්ගත වී | පිළිතුරු ලබා දී නොතිබුණි. | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරීම හා |

| | | | |
|---|---|---|---|
| | තිබූ අතර මෙම මාර්ගය පෙර තාර දැමූ එහෙත් වලවල් සෑදී තිබූ එකක් විය. සම්පූර්ණ මාර්ගයේ දිග මීටර් 110ක් පළල මීටර් 2.7ක් වූ අතර ඒ සඳහා මිලිමීටර් 38 හා මිලිමීටර් 18 ගල් අතුරා ප්‍රිමික්ස් යොදා පළමු දෙවන හා අතුරු ආලේපනයක් ලෙස තාර ඇතිරීමට ඇස්තමේන්තු කර තිබුණද සම්පූර්ණ මාර්ගයටම ගල් එළීම සඳහා ගෙවීම් කරන ලද රු.82,914ක වටිනාකම වැඩිපුර ගෙවීමක් විය. | | පරීක්ෂාවෙන් පසුව ගෙවීම් සිදු කළ යුතුය. |
| (ආ) | දුම්මලකොටුව රණවිරු නෙවිල් ප්‍රියන්ත මාර්ගය තාර දමා අලුත්වැඩියා කිරීම සඳහා ශානක බිල්ඩර්ස් ආයතනය සමඟ ගිවිසුම්ගත වී තිබූ අතර ඇස්තමේන්තු වටිනාකම රු.408,296ක්ද නිමි වැඩ වටිනාකම රු.370,470ක්ද විය. ඇස්තමේන්තුවට වඩා අඩුවෙන් වැඩ නිම කිරීමක් සිදු වී තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | පිළියෙල කරන ලද ඇස්තමේන්තුව අනුව වැඩ නිම කළ යුතුයි. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | (i) සභාවේ ද්විතියික තනතුරු 12ක්ද ප්‍රාථමික තනතුරු 19ක්ද පුරප්පාඩු වී තිබූ අතර විධායක ශ්‍රේණියේ තනතුරක් සඳහා වසර ගණනාවක සිට ආයුර්වේද වෛද්‍යවරයෙක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි. | පුරප්පාඩු සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව. | සභාවට අවශ්‍ය සේවක ප්‍රමාණය නිවැරදිව හඳුනාගෙන එම සේවක ප්‍රමාණය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii) සමාලෝචිත වර්ෂය තුළදී සභාව විසින් අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 118 දෙනෙකු බඳවාගෙන සභා අරමුදලින් රු.54,769,427ක් වැයකර තිබුණි. | අවශ්‍ය අනුමැතියට යොමුකර ඇති බව. | සේවක ප්‍රමාණය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සේවය හැර ගිය සේවකයින් 20දෙනෙකුගෙන් අයවිය යුතු රු.725,391ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය මුදල අය කර ගැනීමට කටයුතු කරන බව. | අයවිය යුතු සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.7 වාහන පද්ධති කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව පරිහරණය කරන කැබ් රථයේ අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා ඉල්ලීමක් කර ඇති බව. | අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | භාවිතයෙන් ඉවත් කර තිබූ ට්‍රැක්ටර් රථ දෙක විධිමත් තක්සේරුවක් යටතේ අපහරණය කිරීමට නිර්දේශ කර තිබූ අතර මෙම ට්‍රැක්ටර් රථ 02 සඳහා පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබාදීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු මණ්ඩලය විසින් වාර්තාවක් ලබා දී නොමැති බව. | තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාෂරීක ක්‍රියාකාරි සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැළැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 15ක් ඉටු කිරීම සඳහා රු.2,576,128ක මුදලක් වැය කර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම් අත්පත් කරගෙන නොතිබුණි. | ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම වියදම් නොවූ නමුත් අපේක්ෂිත නිමවුම් මට්ටම අත්කර ගැනීමට හැකි වූ බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් පිළියෙල කරන ලද සිව් අවුරුදු සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම අනුව සිව් අවුරුදු සැලැස්මෙහි 2023 වර්ෂයට අදාළව ඉටු කිරීමට අපේක්ෂා කළ සංවර්ධන වැඩසටහන් 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි. | සිව් අවුරුදු සැලැස්මට ඇතුලත් කරන ලද බව. | සිව් අවුරුදු සැලැස්ම අනුව ඉටු කිරීමට අපේක්ෂා කරන සංවර්ධන වැඩසටහන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | වැය ශිර්ෂ 09කට අදාළව රු.497,000ක වටිනාකමක් අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදනය කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ එම සම්පූර්ණ ප්‍රතිපාදනයම අයවැයගත කාර්යයන් ළඟා කර ගැනීම සඳහා භාවිත කර නොතිබුණි. | සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම වැය නොවූ අවස්ථාවන් පවතින බව. | අයවැය ගත ඉලක්ක සපුරා ගැනීමට හැකි අයුරින් මෙහෙයුම් කටයුතු සැලසුම් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව වැය ශිර්ෂ 10ක් සඳහා සලසාගෙන තිබුණු ප්‍රතිපාදනයෙන් | වැය ශීර්ෂ ගත ප්‍රතිපාදන ද වැය නොකරන ලද බව. | අයවැය ගත ඉලක්ක සපුරා ගැනීමට හැකි අයුරින් |

| | | |
|---|---|---|
| වැයකර තිබුණේ සියයට 50කටත් අඩු ප්‍රමාණයකි. | | මෙහෙයුම් කටයුතු සැලසුම් කළ යුතුය. |

## 4.3 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| (අ) 2023 වර්ෂයට පෙර මහජන පැමිණිලි සඳහා ලේඛනයක් නඩත්තු කර නොතිබූ අතර පැමිණිලි සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග අනාවරණය කරගත නොහැකි වූ අතර 2023 වර්ෂයේ මහජන පැමිණිලි 102ක් ලැබී ඇති අතර එයින් 14ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලේඛනය ක්‍රමවත්ව පවත්වා ගෙන යන බව දන්වන අතර නිවැරදි කර කටයුතු කරන බව. | ලේඛනයක් නඩත්තු කර පැමිණිලි සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) (i) පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 120ක් 2021 වර්ෂයේ සිට පරිසර බලපත්‍ර ලබා ගැනීම සිදු කර නොමැති වීමෙන් සභාවට විශාල ආදායමක් අහිමි වී තිබූ අතර මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කර්මාන්තකරුවන් වෙත ලිපි යැවීම සිදුකරමින් පවතින බව. | පරිසර බලපත්‍ර ලබා ගැනීමට කර්මාන්තකරුවන් යොමු කළ යුතුය. |
| (ii) 1990 අංක 12 දරණ වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය 21 (1) වගන්තිය යටතේ නිකුත් කරන ලද අපද්‍රව්‍ය මෝචනය/ බැහැරලීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයෙහි පොදු නියම හා කොන්දේසි 01 අනුව බලපත්‍රය වලංගු කාලය අවසන්වීමට මසකට පළමුව බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කළ යුතු බවට දක්වා ඇතත් ආයතන 33ක් එලෙස කටයුතු කර නොතිබුණි. | නොපැමිණි කර්මන්තකරුවන් සඳහා සිහිකැඳවීම් සිදුකර ඇති බව. | ප්‍රඥප්තිය අනුව කටයුතු කළ යුතුය. |

## 4.4 තිරසර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු 17ක් හඳුනාගෙන එම අරමුණු ළඟා කර ගැනීමේ ක්‍රියාකාරකම් 56ක් 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. එම ක්‍රියාකාරකම් 41ක ප්‍රගතිය සියයට 05 සිට සියයට 98 දක්වා පරාසයක පැවතුණි. | යෝජනා ලබාගෙන ක්‍රියාත්මක වූ වැඩසටහන් අඩු ප්‍රගතියක් ගැනීම හේතුවෙන් ප්‍රතිශතයේ වෙනස්වීම සිදුව ඇති බව. | තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |